# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 157/16 — 1975 අප්‍රේල් 04 වැනි සිකුරාදා — 1975.04.04**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස — පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංකයොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

සීඞී/3/2/145

**ගම්සභා ආඥාපනත**

54 වැනි වගන්තිය යටතේ ආඥාව

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 54 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆිලික්ස් රේජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, ඉහත කී වගන්තිය යටතේ නිහගොඩ ගම් ප්‍රදේශය සම්බන්ධයෙන් පනවනු ලැබ 1974 මැයි 27 දින අංක 113/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයෙන් අවසන් වරට සංශෝධිත 1972 අගෝස්තු 09 දින අංක 19/6 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවේ අන්තිම ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එය නැවතත් මෙයින් සංශෝධනය කරමි.

"(ආ) ඒ ගම් ප්‍රදේශය සඳහා අළුතින් ගම් සභාවක් තෝරා පත්කර ගන්නා තුරු ඒ ගම් ප්‍රදේශයේ කටයුතු පරිශීලනය කරන ලෙස නිහගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරී සිරිසෝම රූබසිංහ මහතා පත් කරමි."

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1975, අප්‍රේල් 4 වැනි දින,
කොළඹ දී ය.

4-280


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1 A—ඊ 13640—1,560 (75/04)